*සැ. යු.* - මෙම ගැසට් පත්‍රයේ (VI) කොටසේ 2016 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,976 - 2016 ජූලි මස 15 වැනි සිකුරාදා - 2016.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1120 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1124 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2016 මැයි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 05 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ

## හොරණ නගර සභාවේ

## තනතුරු - පුරප්පාඩු පිරවීම

හොරණ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (හොරණ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් හොරණ නගර සභාවේ තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, නගර සභාව - හොරණ" යන ලිපිනයට 2016.07.28 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහා එවන කවරයේ ඉහල වම් කෙලවරේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (රා.ප.ච. අංක 03/2016 අනුව)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක | 01 | PL-1-2006<br>24250-10x250-10 x270-10x300-12 x330-රු.36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතු යි. |
| 02 | ක්‍රීඩා භූමි පරිපාලක | 01 | MN-1-2006<br>27140-10x300-11 x350 10x495-10 x660-රු.45,540 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම ;<br><br>*සහ*<br><br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත්) (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්,
*පුස්තකාල සහායක තනතුර* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් ද,
*ක්‍රීඩාභූමි පරිපාලක තනතුර* .- ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ද වේ.

*අදාළ විෂය නිර්දේශය :*

I. අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය
II. කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය

එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගත යුතු වේ.

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු යි;
2. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්නව වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු යි;
3. *අයදුම්පත් භාරගන්නා දිනට වයස,*

   පුස්තකාල සහායක තනතුර සඳහා අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතු ය.
   ක්‍රීඩාභූමි පරිපාලක තනතුර සඳහා අවු : 18 ට නොඅඩු හා අවු : 30 ට නොවැඩි විය යුතු ය.

4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය;
2. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයක යටත් වේ;
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව විය යුතුයි ;
4. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, බස්නාහිර පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා හොරණ නගර සභාව වරින්වර නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :- මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතු ය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකය ;
4. මෑතක දී ලබා ගත් චරිත සහතික 2 ක් ;
5. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික ;
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
7. ජාතික හැඳුනුම්පත.

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල හොරණ නගර සභාවේ ලේකම් සතු වේ.

අවම සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පී.ජී.පී. රුද්‍රිගෝ,
ලේකම්,
නගර සභාව - හොරණ.

2016 ජූනි මස 28 වැනි දින,
හොරණ නගර සභා කාර්යාලයේ දී,

ආදර්ශ අයදුම්පත්‍රය

**හොරණ නගර සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය.***

1. (i) මුලකුරු සමඟ නම :————————————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

2. ස්ථිර ලිපිනය :————————————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
6. උපන් දිනය:——————————.
   2016.07.28 වැනි දිනට වයස :——————————.
   අවු:——————————. මාස:——————————. දින:——————————.
7. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද, එසේ වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :——————————.
9. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතු ය) :——————————.
10. සේවා පළපුරුද්ද :——————————.
11. වෙනත් සුදුසුකම් :——————————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:——————————.

13. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට හේතුවන බවද මම දනිමි.

දිනය ::——————————.

——————————.

අයදුම්කරුගේ අත්සන

14. *දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ..............................................................................................................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................................................................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැක / නොහැක. ඔහු මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
දිනය :——————————.

07-592

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2016.08.15 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 111 | 06 | PL-1-2006A (රු.24,250-10x250-10x270 -10x300-12x330-රු.34,610 ) | 8 වන ශ්‍රේණිය (9වසර) සමත් වී තිබිය යුතු ය |

*කායික සුදුසුකම්* .- සෑම අයදුම්කරුවකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*වෙනත්* .- (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සපුරා තිබිය යුතු ය.

*වයස* .- *අවම සීමාව* - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු ය.

උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

*තනතුරෙහි ස්වභාවය* .- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

* පත්වීම ලබා වසර 5ක් ඉක්මවීමට පෙර අංක 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

* වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01 *සෞඛ්‍ය කම්කරු* :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-

තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින්කලට පනවනු ලබන නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියේගවලට ද ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කෙරෙනු ඇත.

නාගරික කොමසාරිස්
මීගමුව.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*මීගමුව මහා නගර සභාව*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*........................තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම :—————————. දුරකථන අංකය :—————————.
2. සම්පූර්ණ නම :—————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :—————————.
4. ස්ථිර පදිංචි ලිපිනය :—————————.
5. තැපැල් ලිපිනය :—————————.
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————.
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————————.
8. ස්ථිර පදිංචිය දරණ පළාත් පාලන අයතන බල ප්‍රදේශය :—————————.
9. උපන් දිනය :—————————.
10. 2016.08.15 දිනට වයස :—————————.
11. අධ්‍යාපන සුදුසුකම් (ඡායා පිටපත් ඇමිණිය යුතුය) :—————————.
12. වෙනත් සුදුසුකම් :—————————.
13. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරු කර තිබේ ද යන වග :—————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත්වන බව හොඳාකාරවම දනිමි.

—————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————————.

07-634

---

# පළාත් පාලන නිවේදන

## ගම්පහ මහා නගර සභාව

2016 වර්ෂයේ පරිපූරක අයවැය ඇස්තමේන්තුව

ගම්පහ මහා නගර සභාවේ 2016.06.30 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා 2016 වර්ෂය සඳහා වන පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2016.06.25 දින සිට දින 07ක් මහජන පරීක්ෂාව සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බව 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 214 (අ) යටතේ දැනුම් දෙමි.

එස්. ඒ. එම්. ඒ. එරංග සේනානායක,
නගරාධිපති.

2016 ජුනි මස 24 වැනි දින,
මහා නගර සභාව,
ගම්පහ.

07-580

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යස්ථා) පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඒ. බී. නිමල් රත්නායක වන මම,

*ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.03.23 දිනැති තීරණ අංක 1818 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබුවා වූ,

ප්‍රාදේශීය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මම තීරණය කරමි.

07-600

---

**අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව**

**ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

2016 මැයි මස 19 වැනි දින දී ය.

කේ. ජී. චන්ද්‍රසිරි,
ලේකම්,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන උප වගන්තිය (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන දින සිට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

කේ. ජී. චන්ද්‍රසිරි.
ලේකම්,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 19 වැනි දින,

07-773

---

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 03 වන වගන්තියේ 01 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් 2016.05.13 දින පවත්වන ලද මුදල් ප්‍රතිපත්ති කාරක සභා රැස්වීමේදී තීරණ අංක 09 මගින් පහත උපලේඛනයේ සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

පලපොත සායක්කාරගේ නිහාල්,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2016 මැයි මස 25 වැනි දින ,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන ) පනතේ දෙවැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දකුණු පළාතේ ,පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රාකාර,ඔහු විසින් සාදනු ලැබු හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ පළාත් සභාව විසින් 2014.08.12 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරනු ලදුව 2014.10.17 දිනැති අංක 1884/ 61 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පල කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද සම්මත අතුරු ව්‍යවස්ථාව වූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව සහ මදුරුවන් රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් 2016.06.01 දින සිට පිළිගෙන තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ඉහත කී 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නේය.

07-564

---

**අම්බලන්ගොඩ නගර සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1)

වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ,පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූද, දකුණු පළාතේ, පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1886/12 හා 2014.10.28 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූද, දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශ තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට අදාල විධිවිධාන අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත් , 2016.05.02 දින තීරණ අංක 69 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

භාරත සමරසේකර,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

2016 මැයි මස 30 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභාව,
අම්බලන්ගොඩ,

07-554

---

## කොලොන්න ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොද්දන ග්‍රාම නිලධාරී වසමේ, ඉඹුල්හිටිතැන්න ගම හරහා පිටකන්ද දක්වා දිවෙන 1/2Km පමණ මාර්ග කොටස "අල්විස් මාවත" ලෙස නම් කිරීම සඳහා ගරු සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා විසින් අනුමත කර ඇති බවත්, ඒ අනුව, 2016.06.13 දිනයේ සිට ඉහත නම් කර ඇති මාර්ග කොටස "අල්විස් මාවත" ලෙස නම් කිරීම සුදුසු බවත් කොලොන්න ප්‍රාදේශීය සභාවේ තීරණ අංක 345 යටතේ තීරණය කර ඇති බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. වී. පී. අයිරාංගනි,
ලේකම් හා සභාවේ බලතල කාර්යය හා
කර්තව්‍ය ඉටුකරන නිලධාරී,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

2016ක් වූ ජුනි මස 13 වැනි දින,
කොලොන්න ප්‍රාදේශීය සභාව,
කොලොන්න.

07-565

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.